සබරගමුව පළාත් සභාව - சபிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சர்**

Ministry Of Education, Information Technology & Cultural Affairs

*Email||:edusabara@gmail.com Facebook||:SabEducationMinistry*

| | | | | | |
|---|---|---|---|---|---|
| **මගේ අංකය**<br>எனது இல<br>My Number | ME/E/2(සබර.ච) | **ඔබේ අංකය**<br>உமது இல<br>Your Number | | **දිනය**<br>திகதி<br>Date | *2016.03.01* |

<u>පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක</u>

<u>සබර/2016/01</u>

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

සියලුම විෂය භාර සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

ප්‍රධාන ගණකාධිකාරී හා / ගණකාධිකාරීවරුන්,

සහකාර අධ්‍යක්ෂ - මෙනේරිපිටිය /අටුළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන,

<u>**පුහුණු වැඩසටහන් / වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානයට අදාළ විවිධ කාර්යයන් සඳහා දීමනා ගෙවීම**</u>

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක EST/8/ALOWN/05/0037-4 ලිපිය මඟින් විවිධ කාර්යයන් සඳහා දීමනා ගෙවීම යටතේ සම්පත්දායක දීමනා රේට් ප්‍රමාණයන් සංශෝධනය කර ඇත.

02 ඒ අනුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 2014/03/20 දිනැතිව නිකුත් කර ඇති පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක සබර/2014/14 යටතේ සඳහන් සම්පත්දායක දීමනාවල ද යම් සංශෝධනයන් සිදු වේ.

03 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST/8/ALOWN/05/0037-4 දරන විවිධ කාර්යයන් සඳහා දීමනා ගෙවීම් ලිපියේ විධිවිධාන සබරගමුව පළාත් සභාව තුළ ද ක්‍රියාත්මක කිරීමට සබරගමුව ගරු ආණ්ඩුකාර තුමා 2016/02/17 දිනැති ලිපිය මඟින් අනුමත කර ඇත.

04 **ඒ අනුව මවිසින් මීට පෙර නිකුත් කර ඇති 2014/03/20 දිනැති පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක සබර/2014/14 චක්‍රලේඛය මෙයින් වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.**

**ගරු අමාත්‍යතුමා** Hon.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax-045-2228042

**අමාත්‍යාංශ ලේකම්** Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-msweerasooriya@gmail.com

**කාර්යාලය** Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

05 2016/03/01 දින සිට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල පුහුණු වැඩසටහන් / වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානයට අදාළ විවිධ කාර්යයන් සඳහා දීමනා සඳහා පහත සඳහන් විධිවිධාන බලාත්මක කරන බව කාරුණිකව දන්වමි. ඒ අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම සංශෝධිත නව චක්‍රලේඛය පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා වියදම් දැරීමට වලංගු වන බව කාරුණිකව දන්වමි.

06 අදාළ නව සංශෝධිත දීමනා සහ කොන්දේසි හා නියාමයන් පහත පරිදි වේ.

01. සම්පත් දායක දීමනා

| කාණ්ඩය | තනතුර | දිනකට උපරිම පැය 03කට යටත්ව පැයකට අනුමත දීමනා ප්‍රමාණය |
|---|---|---|
| I කාණ්ඩය | 1. පිළිගත් විශ්ව විද්‍යාලයක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන් | රු.1000/- |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් | |
| II කාණ්ඩය | 1.පිළිගත් විශ්ව විද්‍යාලයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් | රු.900/- |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල I වන ශ්‍රේණියේ නිලධාරීන් | |
| | III. ජාතික අධ්‍යාපන ආයතනය හා ඊට සමාන්තර අධ්‍යාපන ආයතනවල අධ්‍යක්ෂ හෝ ඊට ඉහළ තනතුරු දරන්නන්. | |
| | IV .ගුරු අධ්‍යාපනඥ සේවයේ I පන්තියේ නිලධාරීන් | |
| III කාණ්ඩය | 1. පිළිගත් විශ්ව විද්‍යාලයක කථිකාචාර්යවරුන් | රු.750/- |
| | II .ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල II වන පන්තියේ නිලධාරීන් | |
| | III. ජාතික අධ්‍යාපන ආයතනය හා සමාන්තර අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් | |
| | IV. ගුරු අධ්‍යාපනඥ සේවයේ II පන්තියේ නිලධාරීන් | |
| IV කාණ්ඩය | 1. පිළිගත් විශ්ව විද්‍යාලයක ආධුනික කථිකාචාර්යවරුන් | රු.600/- |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල III වන පන්තියේ නිලධාරීන් | |
| | III ජාතික අධ්‍යාපන ආයතනය හා සමාන්තර අධ්‍යාපන ආයතනවල කථිකාචාර්යවරුන් | |
| | IV. ගුරු අධ්‍යාපනඥ සේවයේ III පන්තියේ නිලධාරීන් | |
| V කාණ්ඩය | I. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I/II/III ශ්‍රේණිවල නිලධාරීන් | රු.500/- |
| | II. ශ්‍රී ලංකා ගුරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් | |
| | III. ගුරු උපදේශකවරුන් | |
| | IV. උපාධිධාරීන් | |
| VI කාණ්ඩය | අනෙකුත් සුදුසුකම් සහිත දේශකයින් | රු.400/- |

02. සහභාගිවන්නන් සඳහා දීමනා ගෙවීම හා වෙනත් විවිධ කාර්යයන් සඳහා ගෙවීම.

| අයිතමයන් | අනුමත කරන ලද සංශෝධිත නව රේටයන් (රුපියල්) |
|---|---|
| 01. සහභාගිවන්නන් සඳහා දීමනා (දිනකට) | |
| 1.1 මාණ්ඩලික නිලධාරීන් හා විදුහල්පතිවරු | 500/- |
| 1.2 ගුරුවරු/ගුරු උපදේශකවරු | 450/- |
| 1.3 කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | 300/- |
| 02. සංවිධානය හා මෙහෙයවීමේ දීමනා - වැඩමුළු දිනක් සඳහා (එක් අයෙකුට පමණි) | 500/- |
| 03. අධීක්ෂණ දීමනා - වැඩමුළු දිනක් සඳහා (එක් අයෙකුට පමණි) | 400/- |
| 04. පුහුණු මධ්‍යස්ථානාධිපති දීමනා - වැඩමුළු දිනක් සඳහා (එක් අයෙකුට පමණි) | 300/- |
| 05. සහාය කාර්ය මණ්ඩල දීමනා - වැඩමුළු දිනක් සඳහා (උපරිම දෙදෙනෙකු සඳහා) | |
| ආයතන කටයුතු | 300/- |
| ගිණුම් කටයුතු | 300/- |
| 06. යතුරු ලේඛක/පරිගණක ක්‍රියාකරු/ලිපි පරිගණක ගත කිරීමේ දීමනා (වැඩමුළු දිනක් සඳහා) (එක් අයෙකුට පමණි) | 200/- |
| 07. කාර්යාල කාර්ය සහායක/කම්කරු දීමනා - (වැඩමුළු දිනක් සඳහා) (එක් අයෙකුට පමණි) | 150/- |
| 08. ආහාරපාන සහ සංග්‍රහ කටයුතු සඳහා | |
| I එක් අයෙකුට එක් දිනක් සඳහා | 350/- |
| II එක් දිනකට වඩා වැඩි දින ගණනක් පවත්වනු ලබන වැඩමුළු/වැඩසටහන්/සම්මන්ත්‍රණ සඳහා | 475/- |
| 09. ලිපි ද්‍රව්‍ය - එක් වැඩමුළුවක සහභාගිවන්නෙකු සඳහා | 50/- |

කොන්දේසි සහ අදාළ වන නියමන්

(අ) ඉහත 01 අයිතමය යටතේ දැක්වෙන රේට් ගණන් යටතේ කරන ගෙවීම් වලදී එම දීමනා හැර සංයුක්ත දීමනා, ගමන් වියදම් අතිකාල දීමනා ආදී වෙනත් කිසිදු දීමනාවක් නොගෙවිය යුතුයි. (බාහිර සම්පත්දායක ඉන්ධන දීමනාව හැර)

(ආ) ඉහත 02 අයිතමය යටතේ එහි 02,03,04,06,07 අයිතමයන්හි සඳහන් දීමනා ගෙවිය හැක්කේ එක් වැඩමුළුවක් සඳහා එක් අයෙකුට පමණි.

(ඇ) ඉහත අංක 01 හි සඳහන් සම්පත්දායක දීමනා ගෙවීමේදී එම දීමනාව හැර වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමේ පදනම මත කටයුතු කළ යුතුය.

(ඈ) ඉහත අංක 01 හි සඳහන් පරිදි සම්පත්දායක දීමනා ගෙවීමේදී සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා දිනකට පැය 03 ක හා සතියකට පැය 08 ක උපරිමයකට යටත්ව ගෙවීම් කළ හැකිය. අනිකුත් බාහිර සම්පත්දායකයින් සඳහා දිනකට පැය 08 ක උපරිමයකට යටත්ව සම්පත්දායක දීමනා ගෙවිය හැකිය.

(ඉ) සම්පත්දායක මණ්ඩලයක් එකම විට සම්පත්දායකත්වය සපයන අවස්ථා වලදී ඉහත (ඈ) ඡේදයේ සඳහන් පැය ගණන්වල උපරිමයට යටත්ව 01 අයිතමයේ සඳහන් සම්පත්දායක දීමනාවලින් අර්ධය බැගින් වන සේ ඒ ඒ සම්පත්දායකයින් හට ගෙවිය හැකිය.

(ඊ) මීට අමතරව පුහුණු වැඩසටහන්, හා වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා අනුමැතිය හා අත්තිකාරම් සඳහා අනුමැතිය පහත පරිදි ලබා ගත යුතුය.

| අනු අංකය | වැඩමුළු/පුහුණු/සම්මන්ත්‍රණ/ | නිර්දේශය | අනුමැතිය |
|---|---|---|---|
| 01 | රු.100000/- දක්වා | විෂය භාර මාණ්ඩලික නිලධාරී | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 02 | රු.100000/- වැඩි | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් | ප්‍රධාන ලේකම් |

(උ) මීට අමතරව පුහුණු/ සම්මන්ත්‍රණ/වැඩමුළු සඳහා වියදම් දැරිය යුතු පහත අයිතම සඳහා ද නියමිත ගාස්තු ඇස්තමේන්තුවට ඇතුළත් කර අනුමැතිය ලබා ගත යුතුය.

1. තැපැල් ගාස්තු
2. ඉන්ධන වියදම් (අදාළ කි.මී. ගණන අනුව නියමිත හා අනුමත වියදම්)
3. නේවාසික හා දේශන ශාලා ගාස්තු (සාමාන්‍ය හා වායු සමීකරණය සහිතව හා ලබා දෙන පහසුකම් අනුව රජයේ අනුමත ගාස්තු)

4. සහතික පත්‍ර මුද්‍රණය

5. විශේෂ ප්‍රායෝගික වැඩසටහන් සඳහා අධ්‍යාපනික උපකරණ හා රසායනික ද්‍රව්‍ය වලට අදාළ නියමිත වියදම්

(ඍ) අධ්‍යයන චාරිකා /ක්ෂේත්‍ර චාරිකා සඳහා වෙනම ඇස්තමේන්තු අනුමත කරවා ගත යුතුය.

(එ) ඉහත පුහුණු වැඩමුළු,වැඩසටහන්, සම්මන්ත්‍රණ සඳහා අදාළ ඉහත සියලු ගෙවීම් කිරීමේදී මධ්‍යම රජය, පළාත් සභාව, මුදල් කොමිෂන් සභාව නිකුත් කර ඇති චක්‍රලේඛ හා ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති උක්ත දීමනා රේටයන් හා ඊට අදාළ චක්‍රලේඛවලට අනුකූලව/අදාලව කටයුතු කළ යුතුය. මෙම අනුමත දීමනා/වියදම් ඉක්මවා යම් ගෙවීමක් කිරීමට සිදු වන්නේ නම් එම ගෙවීම කිරීමට ප්‍රථම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතුය. සියලුම ගෙවීම් රාජ්‍ය මුදල් රෙගුලාසි අනුව සිදු කළ යුතුය.

(ඒ) පුහුණු වැඩමුළුවලට (බාහිර සම්පත්දායකයින් හැර) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරින් විසින් තමන්ගේ දේශන,වැඩමුළු වලට අදාලව ඉදිරිපත් කරන දේශනයට අදාළ අත් පත්‍රිකා - මොඩියුල සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතුය.

(ඔ) බාහිර සම්පත්දායකයින් සඳහා ඉන්ධන දීමනාව ලෙස චක්‍රලේඛ අනුව රජයේ අනුමත දීමනාව ගෙවිය හැක.

(ඕ) වියදම් ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් සහතිකය අදාළ මාණ්ඩලික නිලධාරින් විසින් ඇස්තමේන්තුවේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

**"මෙම වැය ඇස්තමේන්තුවට අදාල වියදම් සබර 2016/01 චක්‍රලේඛය අනුව හා රජයේ අනුමත චක්‍රලේඛවලට හා රජයේ මුදල් රෙගුලාසිවලට අනුකූලව සකස් කර ඇති බව සහතික කරමි".**

07 මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන හා උපදෙස් තරයේ පිළිපදින ලෙස මින් අවධාරණය කරමි.

Ministry of Provincial Education * Sabaragamuwa *

මහින්ද එස් විරසූරිය
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

මහින්ද එස්. විරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

පිටපත් : 01 ප්‍රධාන ලේකම් - සබරගමුව පළාත් සභාව - දැ.පි.
02 පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරින් - දැ.පි
03 සහකාර විගණකාධිපති - සබරගමුව පළාත් සභාව - දැ.පි.
04 අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - සබරගමුව පළාත් සභාව - දැ.පි.
05 විගණන අධිකාරී - රත්නපුර/කෑගල්ල - දැ.පි.